00021

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2010

ESP 2332 - අධ්‍යාපනය සඳහා පරිගණක තාක්ෂණය

කාලය - පැය තුනයි.

---

දිනය - 2010 දෙසැම්බර් 19 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

01. (i) අධ්‍යාපනය තුළ තාක්ෂණය භාවිත කිරීමේ අවශ්‍යතාවය සනාථ කිරීමට හේතු හතරක් (04) කෙටියෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 40)

(ii) පහත දැක්වෙන සංකල්ප, නිදසුන් මගින් පැහැදිළි කරන්න.
(a) තාක්ෂණය පිළිබඳව ඉගෙනුම
(b) තාක්ෂණයෙන් ඉගෙනුම
(c) තාක්ෂණය සමඟ ඉගෙනුම (ලකුණු 30)

(iii) සිසුන් තුළ අර්ථාන්විත ඉගෙනුමක් ඇති කිරීමට, තාක්ෂණය සහය කරගත හැකි වන්නේ කෙසේදැයි නිදසුනක් ඇසුරින් විස්තර විස්තර කරන්න.

(ලකුණු 30)
(මුළු ලකුණු 100)

02. ඉගෙනුම්-ඉගෙනුම් ක්‍රියාවලිය තුල උපදේශාත්මක ප්‍රවේශයක් සඳහා මෙන්ම සංස්ලේෂණවාදී ප්‍රවේශයක් සඳහා ද පරිගණක තාක්ෂණය උපයෝගී කරගත හැකිය.

(i) පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, ඉගෙනුම සඳහා වන, උපදේශාත්මක ප්‍රවේශය සහ සංස්ලේෂණවාදී ප්‍රවේශය අතර සමානතා-අසමානතා විමසන්න. (ඔබේ පිළිතුර වගුවකින් ඉදිරිපත් කරන්න.)

(a) ශිෂ්‍යයාගේ භූමිකාව
(b) ගුරුවරයාගේ භූමිකාව
(c) තාක්ෂණයේ භූමිකාව (ලකුණු 30)

(ii) තම ඉගැන්වීමේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩි කර ගැනීම සඳහා ගුරුවරයෙකුහට මෙවලමක් ලෙස පරිගණක භාවිත කළ හැකි අවස්ථා හතරක් (04) විස්තර කරන්න.

(ලකුණු 40)

(iii) පරිගණක තාක්ෂණය අධ්‍යාපනය හා සමෝධානය කිරීමේදී ගුරුවරුන් මුහුණපාන අභියෝග තුනක් (03) සහ ඒවා මඟහරවා ගතහැකි අයුරු දක්වන්න.

(ලකුණු 30)

(මුළු ලකුණු 100)

03. ගුරුවරුන්හට, පරිගණක - පාදක ඉගෙනුම් ද්‍රව්‍ය සැලසුම්කරුවන් සහ නිර්මාණය කරන්නන් ලෙස කටයුතු කළ හැකිය.

(i) පරිගණක - පාදක ඉගෙනුම් ද්‍රව්‍ය සැලසුම සහ නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ දී, ගුරුවරයෙකු පසුකළ යුතු ප්‍රධාන අවධි පහ (05) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 50)

(ii) ඉහත භූමිකා ඉටුකිරීම සඳහා ගුරුවරුන් තුළ සංවර්ධනය විය යුතු නිපුණතා තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 30)

(iii) පරිගණක - පාදක ඉගෙනුම් ද්‍රව්‍ය නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක දී 'ඒකීය ප්‍රවේශයකට' වඩා 'කණ්ඩායම් ප්‍රවේශයක්' වඩා සුදුසු වීමට හේතුව පැහැදිළි කරන්න.

(ලකුණු 20)

04. (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) නිරන්තරයෙන් ම විවෘත හා දුරස්ථ අධ්‍යාපන (ODL) පද්ධති සඳහා සහාය වෙයි.

(ලකුණු 30)

(ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, විවෘත හා දුරස්ථ අධ්‍යාපන පද්ධතියකට සහාය වන අයුරු පහත සඳහන් අංශ යටතේ පැහැදිළි කරන්න.

(a) පාඨමාලා කාර්යක්ෂමව ඉදිරිපත් කිරීම.
(b) ඉගෙනීමේ නම්‍යශිලිභාවය.
(c) සහයෝගී ඉගෙනුම දිරිමත් කිරීම

(ලකුණු 30)

(iii) ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක (LMS), ගුරුවරයෙකුහට ප්‍රයෝජනවත් වන ප්‍රධාන ලක්ෂණ තුනක් (03) විස්තර කරන්න.

(ලකුණු 30)

(iv) දුරස්ථ සිසුන් සඳහා ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීමේ දී සැළකිලිමත් වියයුතු සැලසුම්කරණ අංශ හතරක් (4) පැහැදිලි කරන්න.

(ලකුණු 40)

05. (i) පහත සඳහන් පද වලින් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිළි කරන්න.

(a) බහුවිධ මාධ්‍ය
(b) බහුමාධ්‍ය
(c) අන්තර් - ක්‍රියාකාරී බහු මාධ්‍ය

(ලකුණු 30)

(ii) අන්තර් - ක්‍රියාකාරී බහුමාධ්‍ය ඉගෙනුම් ද්‍රව්‍යයක් නිර්මාණය කිරීම සඳහා, තෝරාගත් මාතෘකාවක් යටතේ සංකල්ප සිතියමක් අඳින්න. ඔබේ සංකල්ප සිතියමේ පහත සඳහන් දෑ පෙන්නුම් කළ යුතුය.

(a) විෂය අන්තර්ගතය හා අදාළ ප්‍රධාන මාතෘකාව හා අනුමාතෘකා
(b) සුවිශේෂ ඉගෙනුම් අත්දැකීම්
(c) බහුමාධ්‍ය අන්තර්ග්‍රහණය (සුවිශේෂ මාධ්‍ය අංග)

(ලකුණු 40)

(iii) ඉහත ඉගෙනුම් ද්‍රව්‍යයේ අන්තර්ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා යොදා ගත හැකි උපාය මාර්ග තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 30)
(මුළු ලකුණු 100)

06. පහත දැක්වෙන **<u>ඕනෑම තුනක් (03)</u>** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ඉගෙනුම් සම්පතක් ලෙස World Wide Web (WWW)
(ii) යෙදවුම් මෘදුකාංග (Application Software) සහ ඉගැන්වීමේ දී ඒවායේ ප්‍රයෝජන
(iii) අධ්‍යාපනය සඳහා බහුමාධ්‍ය භාවිතයේ ප්‍රබලතා හා සීමා
(iv) දැනුම ගොඩ නැඟීමේ මෙවලම් ලෙස පරිගණක
(v) පරිගණක - පාදක ඉගෙනුම් ද්‍රව්‍ය ඇගැයීමේ ප්‍රයෝජන

(ලකුණු 33 1/3 බැගින්)
(මුළු ලකුණු 100)

- හිමිකම් ඇවිරිණි. -